පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංක : 35

ආයතනයේ නම : කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් හා වාරිමාර්ග අමාත්‍යාංශය

පාර්ලිමේන්තුවේ ක්‍රම සහ විධි පිළිබඳ කාරක සභාව විසින් සභාගත කරන ලද වාර්තාව සම්බන්ධයෙන් ස්ථාවර නියෝග අංක 124(6) යටතේ ගරු ආයතන භාර අමාත්‍යවරයාගේ නිරීක්ෂණ හා ගනු ලබන පියවර පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කිරීම

பாராளுமன்ற வெளியீட்டுத் தொடர் இலக்கம்: 35

நிறுவனத்தின் பெயர்: கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சு

பாராளுமன்ற முறை மற்றும் விதிமுறைகள் பற்றிய குழு ஆற்றுப்படுத்திய அறிக்கை தொடர்பாக நிலையியல் கட்டளை இலக்கம் 124(6) இன் பிரகாரம் நிறுவனத்திற்கு பொறுப்புடைய கௌரவ அமைச்சரின் அவதானிப்புகளையும் மற்றும் எடுத்த நடவடிக்கைகளையும் பாராளுமன்றத்திற்கு சமர்ப்பித்தல்

Parliamentary Series No: 35

Name of the institution: Ministry of Agriculture, Livestock, Lands and Irrigation

Submission of observations of Hon. Minister and Steps taken with regard to the reports tabled by the Committee on Ways and Means in terms of Standing Order No. 124(6)

පාර්ලිමේන්තු ප්‍රකාශන මාලා අංකය : අංක 35
ආයතනයේ නම : කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය

කාරක සභාව විසින් හඳුනාගත් අඩුපාඩු / කාරක සභාව විසින් දෙන ලද නියෝග	කම්ටුව විසින් පෙන්වා දුන් අඩුපාඩු නිවැරදි කිරීමට / නිර්දේශ ක්‍රියාත්මක කිරීමට ගත් ක්‍රියාමාර්ග / වර්තමාන තත්ත්වය
6.2.1. ශ්‍රී ලංකා රේගුවට අදාළ ගෙවීම් පැහැර හැර ඇති හිඟ බදු ප්‍රමාණය රු.බිලියන 58.6ක් වන අතර එය ප්‍රධාන වශයෙන් රාජ්‍ය ආයතන විසින් ගෙවීම් පැහැර හැර ඇති හිඟ බදු වේ. එසේ බදු ගෙවීම් පැහැර හරින ලද රාජ්‍ය ආයතන වල ලැයිස්තුව ඇමුණුම 1 හි දක්වා ඇත.	ඇමුණුම 01 හි රේගු බදු පැහැර හැර ඇති රාජ්‍ය ආයතන ලැයිස්තුවෙහි කෘෂිකර්ම අමාත්‍යාංශය සඳහන්ව ඇතත්, ගෙවීම් පැහැර හරින ලද කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ ඇති ආයතන හා අදාළ ගෙවිය යුතු බදු ප්‍රමාණය සඳහන් කර නොමැති බැවින් ඒ පිළිබඳව විමසීමක් ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුවෙන් සිදු කර ඇත. අදාළ පිළිතුරු මේ දක්වා ලැබී නොමැති හෙයින් පිළිතුරු ලද විගස ඒ පිළිබඳව පැහැදිලි කිරීම් ඉදිරිපත් කරන බවට කාරුණිකව දන්වා සිටිමි.
6.2.28. ඉන්දු-ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) යටතේ ශ්‍රී ලංකාවෙන් පුවක් අපනයනය සඳහා ඉන්දියානු රජය 107% ක තීරුබදු රහිත සහනයක් ලබා දෙයි. කෙසේ වෙතත්, ශ්‍රී ලංකාව තුල පුවක් අපනයනය කිරීම තහනම් කර ඇතත්, ඉන්දුනීසියාව, මැලේසියාව සහ මියන්මාරය වැනි රටවල් නීති විරෝධී ලෙස පුවක් ආනයනය කර, යම් අගයක් එකතු කිරීමෙන් පසුව ඉන්දියාවට ප්‍රතිඅපනයනය කරනු ලැබේ.	20/08/17 දිනැති අංක 2189/4 දරන ආනයන හා අපනයන පාලන පනත ප්‍රකාර ගැසට් නිවේදනය යටතේ ශ්‍රී ලංකාවට කරුංකා ආනයනය නතර කර ඇති නමුත් ශාක නිරෝධායන රෙගුලාසි අංක 165/2 දරන 1981 නොවැම්බර් 02 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව ශ්‍රී ලංකාවට පුවක් ආනයනය කිරීම තහනම් හෝ සීමා කර ඇති විවිධ අවස්ථාවන් වලදී රජය විසින් ගනු ලබන තීරණ මත නිකුත් කරනු ලබන කැබිනට් පත්‍රිකා වලට අනුව ජාතික ශාක නිරෝධායන සේවය මගින් පුවක් ආනයනය කිරීමට ආනයන බලපත්‍ර නිකුත් කරනු ලැබේ.

වල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

සී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.

6.2.29. දැනට ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද පුවක් කන්ටේනර් 100ක් (ටොන් 1493) රේගුවේ රඳවා ඇත. එක් තොගයක් රාජසන්තක කර ඇති අතර රු. මිලියන 325ක දඩයක් පනවා ඇත. පුවක් ආනයනය නිසා විවිධ කෘමීන් හා දිලීර වර්ග බෝවීම හේතුවෙන් පොල් වගා කර්මාන්තයට එල්ල විය හැකි බලපෑම් හේතුවෙන් පුවක් ආනයනය කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් තහනම් කර ඇත.	අනවසරයෙන් ශ්‍රී ලංකාව තුලට පුවක් ආනයනය කරන අවස්ථා වලදී ශ්‍රී ලංකා රේගුව විසින් එම තොග රඳවා ගනු ලබයි. එලෙස රඳවා තබා ගත තොග සඳහා ශ්‍රී ලංකා රේගුව විසින් ජාතික ශාක නිරෝධායන සේවයෙන් ඉල්ලුම් කරනු ලබන අවස්ථා වලදී එම අදාළ පරීක්ෂාවන් සිදු කර දෙනු ලැබේ. එමෙන්ම ශ්‍රී ලංකාවට පුවක් නීත්‍යානුකූලව ආනයනය කිරීමට පෙර අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් විරෝධතාවක් නොමැති බවට ලිපියක් නිකුත් කළ යුතුය.
6.3.31. ආයෝජන මණ්ඩලය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව සහ ආනයන හා අපනයන පාලන දෙපාර්තමේන්තුව විසින් සහතික කරන ලද බදින ගුදම්වල ආයෝජන මණ්ඩල සමාගම් විසින් අගය එකතු කිරීම සිදු කරනු ලැබේ. ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය (BOI) ආනයන හා අපනයන බදු නීති වලින් නිදහස් කිරීම් භුක්ති විඳියි. කෙසේ වෙතත් නිරෝධායන සහ ශාක ආරක්ෂණ නීති පිළිපැදීම අවශ්‍ය වේ.	අගය එකතු කිරීම සහ ප්‍රතිඅපනයනය සඳහා කරුංකා ආනයනය කිරීම සඳහා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් අනුමත ක්‍රියා පටිපාටියක් සකස් කර ඇති අතර නිෂ්පාදිත බන්ධිත ගබඩා පොල් පර්යේෂණ ආයතනය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ ස්වභාවික ශාක නිරෝධායන සේවාව සහ අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් අනුමත කල යුතුය. සතුටුදායක නිර්දේශයෙන් පසු ආයෝජන මණ්ඩලය විසින් ගබඩාව සහතික කර සමාගමට "අනුමත ව්‍යවසාය තත්ත්වය ලබා දෙනු ලැබේ". එම අනුමැතියත් සමග ආනයන අපනයන පාලන දෙපාර්තමේන්තුව පුවක් අපනයනය කිරීම සඳහා තොග බලපත්‍රයක් නිකුත් කරයි. දැනටමත් ප්‍රයිම් ස්ටාර් ට්‍රේඩින් සමාගම වෙත පුවක් ආනයනය කිරීම සඳහා තොග බලපත්‍රයක් නිකුත් කර ඇත. එමෙන්ම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ සහ අනෙකුත් අදාළ ආයතනවල නිලධාරීන් පුවක් අගය එකතු කිරීමේ ක්‍රියාවලිය සඳහා අනුමැතිය ලබා දීමට අනෙකුත් සමාගම් 14ක නිෂ්පාදන බන්ධිත ගබඩාවල යෝග්‍යතාවය පරීක්ෂා කරනු ලැබේ.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරී
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල

6.2.32. 35%ක අගය එකතු කිරීම මධ්‍යයේ, පුවක් මෙට්‍රික් ටොන් එකක මිල ඇමෙරිකානු ඩොලර් 1300ක් ලෙස පවතින අතර එය දේශීය මිලට වඩා සැලකිය ලෙස අඩුය. මෙය ශ්‍රී ලංකාවේ පුවක් නිෂ්පාදනයට ඇති විය හැකි බලපෑම පිළිබඳ අවධානය යොමු කළ යුතු කරුණකි.	අගය එකතු කළ පුවක් වල මිල පිළිබඳ කිසිදු තොරතුරක් ආයෝජන මණ්ඩලය විසින් බාහිර සහභාගිවන්නන්ට නිල වශයෙන් අනාවරණය කර නොමැත. නමුත් 29/03/2023 දිනැති කැබිනට් තීරණ 29/0516/631/008 අනුව දේශීය පුවක් අපනයනය සඳහා වූ ක්‍රියාපටිපාටිය නියාමනය කිරීම අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට ලබා දී ඇත. ඒ අනුව වාණිජ දෙපාර්තමේන්තුවේ සහය ඇතිව අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පුවක් වෙළඳපල දාමයේ සියලුම අපනයනකරුවන් සහ සැපයුම්කරුවන් ලියාපදිංචිකර අපනයනකරුවන්ගේ අපනයන කාර්යසාධනය සහ ධාරිතාවයන් සැලකිල්ලට ගනිමින් අපනයනකරුවන් සඳහා කෝටා නිකුත් කර ඇත. ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශය විසින් සකස් කරන ලද අනුමත ක්‍රියාපටිපාටියේ සඳහන් පරිදි අගය එකතු කිරීමේ කර්මාන්තය ක්‍රියාත්මක කරන්නේ නම් දේශීය කර්මාන්තයට කිසිදු හානියක් සිදු නොවේ. එසේ නොවුණහොත්, දේශීය පුවක් වෙළෙඳාමට බරපතළ බලපෑමක් එල්ල වනු ඇත.

එල්.පී.එස්. කුමාර
ප්‍රධාන මූල්‍ය නිලධාරි
කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය
අංක. 80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පටුමග,
බත්තරමුල්ල.

ඩී.පී. වික්‍රමසිංහ
ලේකම්
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය
80/5, "ගොවිජන මන්දිරය"
රජමල්වත්ත පාර, බත්තරමුල්ල.